**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 12 ක් යටතේ රු.90,070,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සියළුම ආදායම් සංකේතාංකවල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ආදායම් සංකේතාංක 03 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.23,100,000,000 කින් අඩු කර තිබුණි. ආදායම් සංකේතාංක 09 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.44,980,000,000 කින් වැඩි කර තිබුණි. 2003.05.00 භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය මුල් ආදායම් ඇස්තමේන්තුවෙ සඳහන් රු.31,000,000,000 ක ආදායම රු.13,000,000,000 කින් අඩු කර ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. සමස්තයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රැස්කිරීමට අපේක්ෂා කර තිබු ආදායම රු.21,880,000,000 කින් වැඩි කර ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආදායම් සංකේත 12 කින් රු.391,279,705,499 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අතරින් ආදායම් සංකේත 11 ක මුල් ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම හා ඒවා සංශෝධනය කිරීම තාත්වික පදනමක් මත සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. 2022 වර්ෂයේදී 2023 වර්ෂයට අදාළ ඇස්තමේන්තු සැකසීමේදී පැවති ආර්ථික තත්වය මත ආදායම පුරෝකථනය සිදු කර ඇත. නමුත් අදාළ මූල්‍ය වර්ෂයේ මුල් මාස 06 ක සත්‍ය ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සලකා බලා එම ආදායම් ශීර්ෂයන්ගේ ඇස්තමේන්තු සංශෝධනයන් කරන ලදී. එම ආදායම් ශීර්ෂ යටතේ කරනු ලබන සත්‍ය රැස් කිරීම් සෘජුවම ආර්ථික තත්ත්වය මත මෙන්ම රජය විසින් ඒ ඒ කාලවලදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්, මූල්‍ය වෙළඳපල තත්ත්වයන් මත පදනම් වන බැවින් මීට වඩා තාත්විකව ප්‍රශ්නුත ගත ආදායම් ශීර්ෂ යටතේ ඇස්තමේන්තු සකස් කිරීම අපහසු බව දන්වා සිටිමි. | මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව, සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 7 කට අදාළව සියයට 59 සිට සියයට 510 ක් දක්වා පරාසය තුළ වෙනස් වී තිබුණ බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |

### 2.1.2 හිඟ ආදායම් රැස් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 08 කට අදාළව හිඟ හිටි ආදායම රු.2,434,967,737 ක් වූ අතර ඉන් වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,240,661,755 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට සමස්ත හිඟ හිටි ආදායම සියයට 100 අඩු වීමේ සිට සියයට 91 ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි. | | |
| (i). රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ ආදායම් සංකේත අංක 20.03.02.99 යටතේ 2018 දෙසැම්බර් 31 දිනට පෙර පැවැති සමුච්චිත හිඟ ශේෂය වූ රු.259,079 ක් ද 2020 වර්ෂයට අදාළ රු.232,927 ක් ද වශයෙන් එකතුව රු.492,006 ක වටිනාකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ක්ෂය පදනම යටතේ ලබා දෙන කාර්යාල උපකරණ සඳහා අයවිය යුතු මුදලක් වූ අතර, එම මුදල අදාළ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තුවට තේරී පත්වී නොමැති බැවින් හා මිය යෑම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම හිඟ මුදල වසර 5ක පමණ කාලයක සිට ඉදිරියට එමින් පවතින අතර, මෙම මුදල අයකර ගැනීමට නොහැකි බව දන්වා මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |

| | | | |
|---|---|---|---|
| | කපාහැරීම සඳහා 2024 ජනවාරි 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණි. | | |
| (ii). | ආදායම් සංකේත අංක 20.02.02.99 පොළිය (අනෙකුත්) යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට පෙර පැවැති රු.193,904 ක් සහ 2021 සිට 2023 දෙසැම්බර් 31 දක්වා පැවති රු.111,936 ක් ද වශයෙන් වූ එකතු වටිනාකම රු.305,840 ක් වූ හිඟ ණය ශේෂය අයකර ගැනීමේ හැකියාවක් නොමැති බවත්, ඒ අනුව මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව එම මුදල ඉවත් කිරීම සඳහා 2024 ජනවාරි 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදු කර තිබූ බවත් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |
| (iii). | ආදායම් සංකේත අංක 20.06.04.00 ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකර ගැනීම් යටතේ ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව හා සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව 2018 දෙසැම්බර් 31 දක්වා පිළිවෙලින් රු.763,814,250 හා රු.111,114,479 ක් වශයෙන් එකතුව රු.874,928,729 ක හිඟ හිටි ආදායම් ශේෂයක් සහ ආදායම් සංකේත අංක 20.02.02.01 පොළිය-ණය දීම යටතේ උක්ත ආයතනයන්ට අදාළව පිළිවෙලින් රු.612,893,552 ක් හා රු.2,814,035 ක් සහ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් සඳහා වූ රු.296,351,801 ක් වශයෙන් එකතුව රු.912,059,388 ක හිඟ පොළී ආදායමක්ද, 2018 වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පැවති අතර, මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.1,596,901,410 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 57 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | මු.රෙ. 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයන් 8 කට අදාළව විචලතාවය සියයට 33 ක අඩුවීමේ සිට සියයට 568 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් ව තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | - එම - |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් සිදු නොවී පවත්වාගෙන යන, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.228,825,376 ක් වූ තැන්පත් ගිණුම් 12 ක් පැවතුණි. මෙම තැන්පත් ගිණුම් අතුරින් ගිණුම් 11 ක් විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ වන අතර, එක් තැන්පත් ගිණුමක් තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු වලට අදාළ වේ. | මේ වන විට තැන්පත් ගිණුම් 2 ක පැවති එකතුව රු.11,049,841 ක මුදල අක්‍රිය ශේෂයන් ලෙස හඳුනාගෙන අදාළ අමාත්‍යාංශය සහ ආයතනයේ නිර්දේශ මත 2024 වර්ෂයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. රු.57,696,383 ක් වූ තැන්පතු මුදල සම්බන්ධව අදාළ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කල අතර, ඒ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අයවැය ප්‍රතිපාදන ලබා ගැනීමට අදාළ ආයතනය ඉල්ලුම් කර ඇත. අදාළ ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් නිදහස් කිරීමට පියවර ගනු ලබන අතර ඒ අනුව මෙම තැන්පත් ගිණුම යටතේ නියමිත මුදල ඉදිරියේදී උපයෝජනය කිරීමට නියමිතය. | ප්‍රදාන, ඒවා ලබා දී ඇති අරමුණට යෙදවීමට කටයුතු කිරීම හෝ එසේ කළ නොහැකි නම් මු.රෙ. 570 අනුව අවස්ථාවෝචිතව අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකල යුතුය. |

| | | |
|---|---|---|
| | | තවද, ඉතිරි තැන්පතු ගිණුම් 08ට අදාලව පවතින රු.39,365,503 ක් වූ තැන්පතු මුදල අදාළ කාරණයට උපයෝජනය කරගන්නා ලෙස අදාළ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

**2.4 බැරකම් හා බැඳීම් වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ඇමුණුම iii යටතේ දක්වා තිබූ 2023 වර්ෂයේ බැරකම් ප්‍රකාශනයෙහි රු.235,957 ක 2023 වර්ෂයට අදාලව ගෙවිය යුතුව තිබූ බැරකම් අනාවරණය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. | සියළු බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කල හැකිවන පරිදි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**3.1.1 රාජ්‍ය ණය ගිණුම්ගත කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන පරිගණක පද්ධතියේ CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ මුළු විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් (Explanatory Notes) යටතේ සටහන් අංක 24(II) මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන17,103.2 ක් ලෙස දක්වා තිබුණි.මෙලෙස සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය | ගිණුම්ගත නොවූ විදේශ ණය වටිනාකම, මුලු විදේශ ණය වටිනාකමින් සියයට 0.05 ක් පමණක් වන අතර උපලබ්ධි නොවූ විදේශ ණය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත නිරන්තර උපදෙස් ලබා දෙමින් ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු සම්පාදනය කිරීමට සටහන් කර ගතිමි. එසේම ඒ සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටුවා ඇති විගණන කාර්යාල ද දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | ණය අංක 2016035 අදාළව දෝෂ සහිත විනිමය අනුපාතිකයක් භාවිතා කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එම ණය වටිනාකම රු.මිලියන 962 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |
| (ඇ) | CSDRMS 854-1 වාර්තාවට අනුව ණය අංක 2018003 අදාළව 2023 වර්ෂයට කිසිදු ප්‍රතිලබ්ධිවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලබ්ධි වී ඇති බව දක්වා තිබුණි. දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වීම් අතර EUR 391,123 ක වෙනසක් නිරීක්ෂණය විය. | ණය අංක 2018003 ට අදාලව EUR 391.123 ක වෙනසක් ලෙස දක්වා ඇති උපලබ්ධි වටිනාකම 2023 ජුනි මස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර එය 2023 අගෝස්තු මස ගිණුම් සාරාංශය මගින් ගිණුම් ගත කර ඇත. | - එම - |
| (ඇ) | CSDRMS 854-1 වාර්තාවට අනුව ණය අංක 2022011 අදාළව සමාලෝචිත වර්ෂය තුළ USD 131,000,000 ක් ප්‍රතිලබ්ධි වී තිබුණු අතර, දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ණය මුදලට අදාළව පෙර වර්ෂවලදී ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද ණය වටිනාකම USD 434,861 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙම ණය ගිවිසුමට අදාළව ගිණුම්ගත කර ඇති මුළු ණය ලබා ගැනීම්වල වටිනාකම USD 131,434,861 ක් වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එය USD 133,765,136 ක් ලෙස දක්වා තිබුණි. | 2022011 ණය අංකය යටතේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඇ.ඩො. 181,000,000 ක් උපලබ්ධිවීම් ලෙස 2023 ජනවාරි මස හා මාර්තු මස මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇති අතර එයින් ඇ.ඩො.133,330,274.99 ක් හා පෙර වර්ෂයේ ගිණුම්ගත නොවූ ඇ.ඩො. 434,861 ක් ඇතුළුව ඇ.ඩො. 133,765,136 ක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව ණය අංක 2017034 අදාළව EUR 77,385 ක ඍණ ප්‍රතිලබ්ධිවීමක් අන්තර්ගත කර තිබුණ ද, CSDRMS 854-1 වාර්තාවෙහි එවැනි ඍණ ප්‍රතිලබ්ධිවීමක් දක්නට නොලැබුණි. | 2022 වර්ෂයේ උපලබ්ධි වී තිබූ යූරෝ 468,861.85 ක එනම් රු.180,665,083 ක මුදල 2022 දෙසැම්බර් මස ගිණුම් සාරාංශය මඟින් ගිණුම් ගත කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි මස එය යූරෝ 391,477.35 ක සහ රු.150,846,753 ක් ලෙස සංශෝධනය වන බව මෙම දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.<br><br>එම සංශෝධනයට අනුව වැඩිපුර ගිණුම්ගත කර තිබූ මුදල වන යූරෝ 77,384.05 ක එනම් රු.29,818,329 ක මුදල අගෝස්තු මස ගිණුම් සාරාංශය මඟින් නිවැරදි කර ඇති අතර එය ඍණ උපලබ්ධිවීමක් ලෙස රජයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. | - එම - |
| (ඊ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24 (11) හි ඇතුළත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකය අනුව ආරම්භක ණය ශේෂයට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලබ්ධිවීම් එකතුවීමෙන් අනතුරුව හා සමාලෝචිත වර්ෂය තුළ ණය ගෙවීම් අඩු කළ පසු අවසාන ණය ශේෂයට සමාන විය යුතු වුවද, එලෙස සමාන නොවන ණය ගිවිසුම් 06කට අදාළව රු. මිලියන 107 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2009007 ණය ප්‍රදායක සමග සිදු කරන ලද සැසඳීමේදී 2015.08.24 දිනැතිව සටහන් කර තිබූ වැරදි අගයන් 2023 පෙබරවාරි මස නිවැරදි කර ඇති අතර එය රජයේ මූල්‍ය ප්‍රකාශන වලද ගලපා ඇත.<br><br>2010117 සහ 2010121 යන ණය අංක දෙක ඇමෙරිකානු ඩොලර් වලින් ලබාගෙන තිබූ ණය ගිවිසුම් දෙකක් වන අතර පසුව XDR වලට පරිවර්තනය කර ඇත. එම ණය අංක දෙකට අදාල ණය ආපසු ගෙවීම් කිරීම අවසන් වූ විට අදාල විනිමය පරිවර්තනය කිරීමේදී සිදු වූ වෙනස, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් CSDRMS පද්ධතියේ නිවැරදි කර ඇති අතර එය රජයේ මූල්‍ය ප්‍රකාශන වලද ගලපා ඇත.<br><br>1983 වර්ෂයේදී ලබාගත් 1983008 දරන ණය මුදල 2005 වර්ෂයේදී ප්‍රතිව්‍යුහගතකරණය කර ඇති අතර එමගින් ඇති වී ඇති වෙනස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් CSDRMS පද්ධතියේ නිවැරදි කර ඇත. එය 2023 අවසන් ගිණුම් | - එම - |

| | | |
|---|---|---|
| | මගින් රජයේ මූල්‍ය ප්‍රකාශන වල ගලපා ඇත.<br><br>2002054 දරන ණය මුදල ප්‍රංශ ප්‍රෑන්ක් විනිමය අනුපාතයෙන් ලබාගෙන පසුව යූරෝ විනිමය අනුපාතයට පරිවර්තනය කර ඇත. ණය මුදල ගෙවා අවසන් වීමේදී අදාළ පරිවර්තනය කිරීමේදී ඇති වී ඇති වෙනස හා 2002055 දරන ණය මුදලද ප්‍රංශ ප්‍රෑන්ක් විනිමය අනුපාතයෙන් ලබාගෙන පසුව යූරෝ විනිමය අනුපාතයට පරිවර්තනය කර ඇත. ණය ප්‍රදායක සමග කරන ලද ශේෂ සැසඳීමේදී හඳුනාගත් එම වෙනස විනිමය පරිවර්තනය කිරීමේදී ඇතිවූ වෙනසක් ලෙස සලකා 2023 පෙබරවාරි මස CSDRMS පද්ධතියේ ගලපා ඇති අතර රජයේ මූල්‍ය ප්‍රකාශන වලද නිවැරදි කර ඇත. | |
| (උ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(1) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී, 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට සහ 2023 ජනවාරි 01 දිනට USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිදු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. | මෙම ණය මුදල ඇ.ඩො. වලින් පවත්වාගෙන ගියද ණය ආපසු ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියල් වලින් ආපසු ගෙවන ලද මුදල ඇ.ඩො. වලට පරිවර්තනය කිරීමේදී දෝෂ සහගත විනිමය අනුපාතයක් භාවිතා කිරීම හේතුවෙන් CSDRMS වාර්තාවේ මෙම මුදල්ද අදාල ඇ.ඩො. වටිනාකම වැරදි අගයක් සටහන් වී ඇත. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශන වලද එම විනිමය අනුපාතය භාවිතා කිරීමෙන් වූ වරද 2023 වර්ෂයේ ණය ආපසු ගෙවීම් වලින් ගලපා නිවැරදි කර ඇත. | - එම - |

### 3.1.2 විදේශ ප්‍රදාන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 විදේශ ප්‍රදාන (මුදලින් ලැබීම්) යටතේ වර්ෂයේ විදේශ ප්‍රදාන වියදමේ එකතුව රු.මිලියන 5,333 ක් ලෙස දක්වා තිබුණු අතර අදාළ තැන්පතු ලෙජර් අනුව එම වියදමේ එකතුව රු.මිලියන 5,302 ක් විය. | විදේශ ප්‍රදාන වශයෙන් ලද මුදල් වල භාරකාරත්වය හා ගිණුම්ගත කිරීමේ කටයුතු පමණක් මෙම දෙපාර්තමේන්තුවට අදාල වන අතර අදාළ ප්‍රදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබන්නේ රජයේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වන බැවින් එම මුදල් නියමිත අරමුණු වලට උපයෝජනය නොවීම අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල වගකීමක් වේ. | ප්‍රදායකයන්ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණුවලටට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම. |
| (ආ) | 2023 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත විශේෂ ප්‍රදාන ලෙස ලැබී ඇති නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු.මිලියන 107.6 ක් විය. | මේ වන විට තැන්පත් ගිණුම් 2 ක එකතු වටිනාකම රු. 11,049,841 ක අක්‍රිය ශේෂයන් ලෙස හඳුනාගෙන අදාළ අමාත්‍යාංශය සහ ආයතනයේ නිර්දේශ මත 2024 වර්ෂයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.<br><br>රු.57,696,383 ක් වූ තැන්පතු ශේෂයක් ඇති ගිණුම සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කල අතර, ඒ අනුව අක්මුදල් නිදහස් කර ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අයවැය ප්‍රතිපාදන ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත. අදාළ ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් නිදහස් කිරීමට පියවර ගනු ලබන අතර ඒ අනුව මෙම තැන්පත් ගිණුම යටතේ නියමිත මුදල ඉදිරියේදී උපයෝජනය කිරීමට නියමිතය. | - එම - |

| | | | |
|---|---|---|---|
| | | තවද, ඉතිරි තැන්පතු ගිණුම් 07ට අදාළව පවතින රු.38,863,894 ක් වූ තැන්පතු මුදල අදාල කාරණයට උපයෝජනය කරගන්නා ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | 2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමඟ එකතු වටිනාකම් ජපන් යෙන් 700,000, යූරෝ 132,710,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841, කොරියන් වොන් 400,000, චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට අනාවරණය නොවුණි. | විදේශ ප්‍රදානයන් උපයෝජනයට අදාළ විස්තර මෙම දෙපාර්තමේතුව සතුව නොමැති අතර ඒ පිළිබඳව පැහැදිලි කිරීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි. | ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

### 3.1.3 උපණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------ | ------------------------------------ | ------------------ |
| (අ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රු.190,789,890,831 ක උපණය ශේෂයක් ලැබිය යුතුව පැවතුණි. අදාළ ආයතනය උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ක ට වඩා වැඩි රු.1,316,324,489 ක හිඟ උපණය ශේෂයක් පැවතුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | රාජ්‍ය උපණය ලබා දීම, පාලනය හා උපණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම රු.9,439,025,443 ක් වූ අතර, ආයතන 03 කට අදාළව ගිවිසුම් ප්‍රකාරව නොගෙවූ වසර 05 කට වඩා වැඩි නොගෙවූ පොළී වටිනාකම් එකතුව රු.912,059,388 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | - එම - |
| (ඇ) | 2023 ජනවාරි 01 දින වන විට ආයතන 2 ක ට අදාළ වූ උපණය ගිවිසුම් 4 ක් යටතේ පැවති උප ණය ශේෂ එකතුව වූ රු.114,487,221 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු හිඟ මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | • සණස ආයතනයේ රු.11,114,479 උපණය මුදල අය නොවන බැවින් නීතිමය කටයුතු සිදුකරමින් පවතී.<br>• රු.455,065 ක ණය ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන පද්ධති අනුව ශේෂයක් නොමැති බව දන්වා ඇත.<br>• රු.4,496 ක මුදල ආපසු ගෙවීම සඳහා අරමුදල් නොමැති අතරම, අරමුදල පොළී ආදායම ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත අරමුදල් මාරු කර ඇත.<br>• රු.102,913,181 ක මුදල මීට පෙර අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් උපණය යෝජනා ක්‍රමයක් යටතේ හිඟ ණය ශේෂයක් ලෙස රජයට ලැබිය යුතු මුදලක් වශයෙන් සටහන් කර ඇත. එසේම මෙම ණය යෝජනා ක්‍රමය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍යනය කර තිබූ අතර එම ශේෂයන්ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ලේඛන වලින් ඉවත් කර ඇති බව දන්වා ඇත. | - එම - |
| (ඈ) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආරම්භක සහ අවසාන දිනට වූ උපණය ශේෂයන්, ඊට අදාළ එක් එක් උප ණය ලබා දුන් ආයතනවලින් ලද ණය ශේෂ සනාථ කිරීමේ ලිපි අනුව වූ ශේෂයන් සමඟ සැසඳීමේදී විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල 2023 දෙසැම්බර් 31 දිනට | ශේෂයන් අතර විචලනයට පහත කරුණු හේතු වී ඇත.<br>• ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත මුදා හරින ලද රු.35,287,500 ක ණය මුදල භාණ්ඩාගාරය විසින් මුදා හරින ලද්දේ 2023.12.31 දින වුවද | - එම - |

| | | | |
|---|---|---|---|
| | උප ණය ශේෂය රු.මිලියන 78 ක් වැඩියෙන් දක්වා තිබුණි | බැංකුව විසින් එම මුදල 2024 වර්ෂයේදී ගිණුම් ගත වී තිබීම.<br><br>• රු.2,828,000 ක මුදල මෙම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ඇත්තේ 2022.12.29 දින වන අතර, ව්‍යාපෘති කාර්යාලයෙන් ලංකා බැංකුව වෙත එම මුදල ලැබී ඇත්තේ 2023 වර්ෂයේදී බැවින් එම වටිනාකම 2023 වර්ෂයේ එම බැංකුව විසින් ගෙවිය යුතු ශේෂයට ඇතුලත් වී තිබීම.<br><br>• රු.7,440,000 ක මුදල මෙම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ඇත්තේ 2022.12.29 වන අතර, ව්‍යාපෘති කාර්යාලය මගින් කොමර්ෂල් බැංකුව වෙත එම මුදල ලැබී ඇත්තේ 2023 වර්ෂයේදී බැවින් එම වටිනාකම 2023 වර්ෂයේ එම බැංකුව විසින් ගෙවිය යුතු ශේෂයට ඇතුලත් වී තිබීම. | |
| (ඉ) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට වූ උපණය ශේෂයන් හා අදාළ ආයතනයන්ගේ මූල්‍ය ප්‍රකාශන අනුව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු උපණය ශේෂයන් සැසඳීමේදී ආයතන දෙකකට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල උප ණය ශේෂය රු.මිලියන 229 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | • දේශීය ණය හා සංවර්ධන අරමුදලට අදාලව රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව දක්වා ඇති 1,040,795,498 ක ශේෂය සමග සමාන වන බව ආයතනය විසින් එවා ඇති ශේෂ තහවුරු ලිපියෙහි දැක්වේ.<br><br>• කොළඹ මහ නගර සභාවට අදාල උප ණය ගිණුමේ ශේෂය රු.2,186,551,094 ක් වන අතර එම ආයතනයට ශේෂ සනාථ කර එවන ලෙස ඉල්ලීම් කලද මේ දක්වා පිළිතුරක් එවා නොමැත. | - එම - |

### 3.1.4 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වී තිබූ රු.මිලියන 168,541.48 ක් හා ඇ.ඩො. මිලියන 59.88 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 17 ක් සහ රු.මිලියන 29,250 ක් හා ඇ.ඩො. මිලියන 200 ක වටිනාකමින් යුතු සහන ලිපි 9 කට අදාළව 2023 දෙසැම්බර් 31 දින වන විට නැවත වලංගු කාලය දීර්ඝ කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 10 ක දී නිකුත් කළ රු.මිලියන 115,977.35 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 10ක දී නිකුත් කළ රු.මිලියන 28,838.4 ක් වටිනා සහන ලිපි 2023 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, අදාළ වලංගු කාලය ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාල භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි වලට අදාල වලංගු කාලය විගණිත දිනය වන විටත් දීර්ඝ කිරීමට කටයුතු නොකිරීම පිළිබඳව වර්තමාන තත්වය පහත පරිදි වේ.<br><br>• **ලංකා ධීවර සංස්ථාව**<br>2024.04.08 දින රැස්වීමේදී සාකච්ඡා කල ආකාරයට මෙම හිඟ මුදල් පියවීම සම්බන්ධ කටයුතු කඩිනම් කර එහි ප්‍රගතිය වාර්තා කරන ලෙස, මෙම භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ලංකා ධීවර සංස්ථාව වෙත 2024.04.30 දිනැති ලිපියෙන් දන්වා ඇත.<br><br>• **ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව**<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම මත භාණ්ඩාගාර ඇපකරයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2023.12.29 දිනැති ලිපිය මගින් නිර්දේශ කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත 2024.01.05 දින වලංගු කාලය 2023.10.16 සිට 2028.12.31 දක්වා දීර්ඝ කරන ලදී. | බැංකු ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |

- **නෝර්ත්සී සමාගම**
2024.02.08 දින පැවති රැස්වීමේදී නෝර්ත්සී සමාගම සුදුසු ආයෝජකයෙකු වෙත ලබා දිය යුතු බවත් නෝර්ත්සී සමාගමේ ශේෂ පත්‍රය සලකා බලා ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට සුදුසු තීරණයක් ගැනීමට පහසු වනු පිණිස පිළිගත හැකි අවස්ථා තුනක් ගෙන අධ්‍යනය කිරීම රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය මගින් සිදු කල යුතු බවත් ප්‍රතිව්‍යුහගතකරණ කිරීමේ ක්‍රමවේදයක් තීරණය කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමත් කඩිනමින් එම කටයුත්ත ආරම්භ කල යුතු බවත් තීරණය වී ඇත.

- **ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය**
රටේ පවතින අහිතකර ආර්ථික තත්වය හේතුවෙන් ද්විපාර්ශ්වික බාහිර ණය සඳහා සේවා සැපයීම තාවකාලිකව අත්හිටුවන ලද බවට කළ රජයේ නිවේදනය අනුව, ණය සේවා ගෙවීම අත්හිටුවා ඇති අතර 2022 අප්‍රේල් සිට කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බවත් මේ සම්බන්ධ තත්වය ඉදිරියේදී දන්වා එවන බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2023.07.19 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

- **ලිට්‍රෝ ගෑස් සමාගම**
2023.09.30 දිනට ලංකා බැංකුව විසින් එවන ලද භාණ්ඩාගාර ඇපකර ශේෂ ලැයිස්තුවට අනුව මෙම භාණ්ඩාගාර ඇපකරය 2023.02.01 දින වන විට සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇත. ඒ අනුව 2024.01.04 දින අප කල ඉල්ලීමට අනුව ලංකා බැංකුව විසින් මුල් භාණ්ඩාගාර ඇපකරය

2024.01.18 වන දින එවා ඇති අතර එය මේ වන විට භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුවෙන් ඉවත් කරඇත.

- **සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම**
  2024.01.11 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද නිර්දේශය අනුව 2024.01.18 දින මෙම ඇපකර දෙකෙහි වලංගු කාලය 2023.11.11 සිට 2024.11.11 දක්වා දීර්ඝ කර ඇත.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**
  අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0045/621/002 සඳහා 2024.01.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලංකා ඛනිජතෙල් සංස්ථාව වෙනුවෙන් නිකුත් කර තිබූ රුපියල් බිලියන 100 ක භාණ්ඩාගාර ඇපකරයේ වලංගු කාලය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය හා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය යටතේ 2024.02.12 වන දින වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

- **සමුපකාර තොග ආයතනය**
  සහන ලිපි වල වලංගු කාලය මේ වන විටත් ඉක්ම ගොස් ඇති අතර මේ සම්බන්ධයෙන් අදාල පාර්ශව සමඟ සාකච්ඡා කර මහා භාණ්ඩාගාරයට බරක් නොවන පරිදි අදාල හිඟ මුදල් පියවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස, මෙම භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දෙන ලද සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත 2023.02.06 දිනැති ලිපියෙන් දන්වා ඇත. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව 2023.02.24 දිනැති ලිපියෙන් වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශ ලේකම්ට මේ සම්බන්ධව දන්වා ඇති නමුත් මේ වන තෙක් පිළිතුරක් ලැබී නැත.<br><br>• **මිහින් ලංකා සමාගම**<br>2024.03.21 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලද නිර්දේශය අනුව 2024.03.28 දින මෙම ඇපකරයන්හි වලංගු කාලය 2024.12.31 දක්වා දීර්ඝ කර ඇත.<br><br>• **සීමාසහිත ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම**<br>2023.12.31 දින වන විට කල් ඉකුත් වී තිබූ නමුත් 2024.01.11 දිනැති ලිපිය මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත සහ භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය අනුව මෙම සහන ලිපි වල වලංගු කාලය 2023.12.31 සිට 2024.12.31 දක්වා 2024.01.18 දින දීර්ඝ කරන ලදී. | |

### 3.1.5 දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන

අංක 23/1221/604/121 හා 2023 ජුනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දේශීය ණය ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ඒ අනුව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගෙන තිබූ රු.2,368,416,351,609 ක භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබා දී තිබූ රු.344,728,000,400 ක අත්තිකාරම් මුදල, රු.220,797,000,000 වටිනා නව භාණ්ඩාගාර බිල්පත් සහ රු.2,492,347,352,009 ක් වටිනා නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. | අංක 23/1221/604/121 හා 2023.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හා අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි දේශීය ණය ප්‍රතිව්‍යාහගතකරණ වැඩ සටහන ක්‍රියාවට නංවන ලද අතර ඒ අනුව විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | තොරතුරු ඉදිරිපත් කිරීමකි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එකතු වටිනාකම රු.3,204,461,897,219 ක් ව පැවති භාණ්ඩාගාර බැඳුම්කර 2023 සැප්තැම්බර් 14 දින නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. | අංක 23/1221/604/121 හා 2023.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හා අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි දේශීය ණය ප්‍රතිව්‍යහගතකරණ වැඩ සටහන ක්‍රියාවට නංවන ලද අතර ඒ අනුව විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | - එම - |
| (ඇ) | ඇ.ඩො.788,237,384 ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 2023 අගෝස්තු 15 දින භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. | අංක 23/1221/604/121 හා 2023.06.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හා අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි දේශීය ණය ප්‍රතිව්‍යහගතකරණ වැඩ සටහන ක්‍රියාවට නංවන ලද අතර ඒ අනුව විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | - එම - |
| (ඈ) | රජයේ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශීය විනිමය බැංකු වලට අදාළව මහජන බැංකුවෙන් ලබා ගෙන තිබූ ඇ.ඩො.85,943,611 ක ණය මුදල 2023 නොවැම්බර් 11 දින භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ | - එම - |
| (ඉ) | තවද, ඉහත නීතිය යටතේ ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඇ.ඩො. මිලියන 240 ක විදේශීය විනිමය බැංකු ඒකක ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් 2023 නොවැම්බර් 02 දින අත්සන් කර තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | - එම - |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 09 ක් ද, ද්විතීයික මට්ටමේ නිලධාරී තනතුරු 15 ක් ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත්, අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |